කටකථා නැතිනම් ප්‍රලාප යනු සාමාන්‍යයෙන් ප්‍රවෘත්තියක් හෝ විශේෂාංග ලිපියක් පළ කරනා මාධ්‍යවේදියෙකු විසින් මගහැරීමට උත්සාහ කරනා වචනයකි. මන්දයත්, කටකථා හෝ ප්‍රලාප සඳහා මූලාශ්‍රයන් දැක්වීම හෝ නිරවද්‍යතාවය තහවුරු කරගැනීම අසීරු කරුණක් වන බැවිනි. එනමුත් කටකථාද මාධ්‍යකරණය තුළ පවත්නා දෙයක් බවට පත්ව ඇති සෙයක් පෙනේ. විශේෂයෙන්ම ඍජුව නම් හෝ මූලාශ්‍ර සඳහන් කිරීමට අසීරු වන, එනමුත් සිදුවී ඇති බවට නිශ්චිතව තහවුරු වී ඇති සමාජ අභිරුචියට හේතු වන යමක් පළ කිරීම සඳහා කටකථා තීරුවක් උපයෝගී කරගැනීමට හැක. වර්තමානයේ පවා දක්නට ලැබෙනා දේශපාලන ඕපාදූප තීරු එයට නිදසුනකි.

කෙසේ නමුත් මෙවැනි කටකථා, ඕපාදූප තීරුවක් යහපතට මෙන්ම අයහපතටද භාවිතා කළ නොහැකිද? මූලාශ්‍ර සඳහන් කිරීම අනවශ්‍ය වීම මෙන්ම ඍජුව නම් සඳහන් කිරීමට අනැවැසි වීම හරහා යම් හෙයකින් සාවද්‍ය තොරතුරක් හෝ ජනගත විය නොහැකිද? එසේ හැකියාවක් තිබීමම කටකථා/ඕපාදූප තීරුවක මූලික කොන්දේසිය වන්නේද? එසේත් නැතිනම් එවැනි තීරුවක් සඳහා පවා යම් කිසි මගපෙන්වීමේ උපදෙස් මාලාවක් තිබිය යුතුද? මේ ඒ සම්බන්ධයෙන් ඔබේ අදහස් විමසීමයි.
**#mediaethicsSL #SinhalaPress #lka #Lankadeepa #EnglishPress #DailyMirror**